# බලන්ගොඩ නගර සභාව

## බලන්ගොඩ නගර සභාවට අයත් බලන්ගොඩ පොදු වෙළඳසැල අංක 03 දරණ එළවළු කඩ කාමරයට සුදුසු බදු කරුවෙක් තෝරා ගැනීම සඳහා ලංසු අයදුම්පත් කැඳවීම.

2017 මැයි මස පළමු වන දින සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන එළවළු කඩ කාමරය බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බලන්ගොඩ නගර සභාවේ ලේකම් එස්.එච්.ජී. කරුණාරත්න වන මා විසින් 2017 අප්‍රේල් 20 වන දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දී කාර්යාලයීය දුරකථන අංක 045 - 22 872 75 ඇමතීමෙන් හෝ urbanbg@ sltnet.lk වෙතින් ලබාගත හැකි ය.

**ලංසු අයදුම්පත් නිකුත් කිරීම:**

2017 අප්‍රේල් 19 වන දින ප.ව. 3.00 දක්වා ලංසු අයදුම්පත් බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ලංසු අයදුම්පත් භාර ගැනීම:**

2017 අප්‍රේල් මස 20 වන දින පෙ.ව.10.00 දක්වා ලංසු අයදුම්පත් භාර ගනු ලැබේ. ලංසු අයදුම් කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් හෝ **"ලේකම් බලන්ගොඩ නගර සභාව"** යන ලිපිනයට 2017 අප්‍රේල් මස 20 වන දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ තැපැලෙන් හෝ යොමුකළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලංසු අයදුම්පත් විවෘත කිරීම:**

2017 අප්‍රේල් මස 20 වන දින පෙ.ව. 10.30 ට බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ලංසු අයදුම්පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ ලිඛිතව බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකි ය.

### ඉහත කී උපලේඛනය

| අනු අංකය | ලංසු අයදුම්පත් කැඳවනු ලබන වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසු අයදුම්පත් ගාස්තු | | | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | එකතුව | |
| 01 | පොදු වෙළඳ සැල අංක 03 දරණ එළවළු කඩ කාමරය | රු. 5,000.00 | රු. 1,000.00 | රු. 150.00 | රු. 1,150.00 | රු. 7,100.00 |

**විශේෂ කොන්දේසි:**

- ✓ ලංසු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ තමා ඉදිරිපත් කරනු ලබන ලංසුවේ නම සඳහන් කළ යුතු ය.
- ✓ අවම ලංසුවට අමතරව රජය විසින් පනවනු ලබන බදු මුදල් ද ගෙවිය යුතු ය.
- ✓ තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බලන්ගොඩ නගර සභාවට ගෙවිය හැකි ය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුලිය එක වර ගෙවා 2017.04.30 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතු ය.
- ✓ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බලන්ගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතු ය.

2017 මාර්තු මස 28 වන දින,<br>
බලන්ගෙඩ නගර සභාවේදීය.

එස්.එච්.ජී.කරුණාරත්න,<br>
ලේකම්/විශේෂ කොමසාරිස්,<br>
බලන්ගොඩ නගර සභාව